# "බෙල්ල කැපීම" - අධිකරණ වෛද්‍ය අභියෝගයක්

වෛද්‍ය **මුදිත විදානපතිරණ** ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය හා අධිකරණ වෛද්‍ය විශේෂඥ අධිකරණ වෛද්‍ය දෙපාර්තමේන්තුව, වෛද්‍ය පීඨය. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සහ
වෛද්‍ය **ජේ.සී. සමරවීර** වැඩබලන විශේෂඥ අධිකරණ වෛද්‍ය දිස්ත්‍රික් මහරෝහල, වවුනියාව.

## හැඳින්වීම

"බෙල්ල කැපීම" යන වචනය ඇසූ සැනින් අපේ හිතට එන්නේ තව කෙනෙකුගේ අනාගතය විනාශ වන අයුරින් කටයුතු කිරීමයි. එය එසේ වන්නේ බෙල්ල කැපීම අප සමාජයේ එතරම් සුලභ බැවිනි.

නමුත් මා අද ඉදිරිපත් කරන්නේ මිනිසෙකුගේ ප්‍රාණය විනාශ වන අයුරින් බෙල්ල කැපීම පිළිබඳවය. එය අධිකරණ වෛද්‍ය විද්‍යාවේ අභියෝගයකි. "බෙල්ල කැපීම" පිළිගත් මිනීමැරුම් ක්‍රමයකි. එමෙන්ම සමහරක් විට එය සියදිවි නසාගැනීමට ද යොදා ගනී. නමුත් එය ඉතා කලාතුරකින් අනතුරක් ලෙස ද සිදුවිය හැක.

ඇසින් දුටු සාක්ෂියක් හෝ සිද්ධිය පිළිබඳ ඉතිහාසයක් නොදන්නා විට, "බෙල්ල කැපීම" සිදුවූයේ මිනිමැරීමක්, සියදිවි නසාගැනීමක් හෝ අනතුරක් ලෙස දැයි තීරණය කිරීම අධිකරණ වෛද්‍යවරයාට ඇතිවන අභියෝගයකි. මෙයට කදිම උදාහරණයක් වන්නේ ඕ.ජේ. සිම්සන්ගේ පෙර බිරිඳ වන නිකොල්ගේ මල සිරුර "බෙල්ල කැපීමක්" සහිතව හමුවූ විටයි. "බෙල්ල කැපීමෙන්" වන මරණ උපතේ සිට වයෝවෘද්ධ වයස දක්වාම දැකිය හැකිය. උදාහරණයක් ලෙස සමහර මව්වරුන් උපන් හැටියේ බිළිඳන්ගේ බෙල්ල කපා ඝාතනය කරයි. සමහර වයෝවෘද්ධ පුද්ගලයන් ද මෙලෙස මරා දමනු ලබයි. මෙයට කදිම උදාහරණයක් මම ඔබට ඉදිරිපත් කරන්නෙමි. වරෙක සමලිංගික පුද්ගලයෙකු තම වාහනය තුළ බෙල්ලේ කැපුමක් සහිතව මියගොස් තිබුණි.

## සිද්ධි ඉතිහාසය


ඔහු අවුරුදු 51 ක් වයසැති විවාහක පුද්ගලයකි. ඔහු මියගොස් සිටියේ තම වාහනයේ රියදුරු අසුනේය. වාහනය තිබුණේ වෙරළ අසබඩ ප්‍රධාන මාර්ගයකය. එය මුලින්ම දුටුවේ සවස 1.30ට ය. එම ස්ථානයට වහාම අපරාධ ස්ථාන පරීක්ෂා කරන පොලිස් ඒකකය (SOCO) පැමිණියේය. එය අපරාධ ස්ථානයක් ලෙස නම් කර ප්ලාස්ටික් පටි යොදා අපරාධ ස්ථානය වෙන් කරන ලද අතර එයට ආරක්ෂාව ද සැපයීය.

මරණකරු රියදුරු අසුනේ ඉඳගත් අයුරින් සිටියේය. බෙල්ලේ ගැඹුරු කැපුමක් තිබුණු අතර, ලේ දහරා පහළට ගලා ගොස් තිබූ අයුරු සුදු කමිසයේ දක්නට ලැබුණි. මියගිය තැනැත්තාගේ අතේ හෝ වාහනය තුළ හෝ අපරාධ ස්ථානයේ ආයුධයක් දක්නට නොලැබුණි. අසුන මත ලේ විලක් තිබුණි.

ඩෑෂ්බෝඩ් එක හා වින්ඩ්ස්ක්‍රීන්ඩ් එක මත ලේ පැල්ලම් රාශියක් තිබුණි. මහේස්ත්‍රාත්තුමාගේ නියෝගය හා අධීක්ෂණය යටතේ වෛද්‍ය වරයාගේ පරීක්ෂාව සිදුවිය.

පොලිස් නිලධාරීන් විසින් ඡායාරූප විඩියෝ හා මිනුම් ලබාගැනීමෙන් පසුව සාම්පල ලබාගත්තේය. වාහනයේ ඇඟිලි සළකුණු ඇත්දැයි පරීක්ෂා කළේය. පරීක්ෂණ අවසානයේ මල සිරුර පොලිතින් බෑගයක දමා ළඟම පිහිටි මහරෝහලේ මෘතශරීරාගාරයට යවන ලදී.

පශ්චාත් මරණ පරීක්ෂණයේදී පහත කරුණු හෙළිවිය. ඇඳුම් වල සිරස් අතට බේරුණු ලේ පැල්ලම් තිබුණි.



*ඇඳුම් වල සිරස් අතට පිහිටි ලේ පැල්ලම් විය.*

බෙල්ලේ ඉදිරිපස ඇලට පිහිටි ගැඹුරු කැපුමක් තිබුණි. එහි වම් කෙලවර බෙල්ලේ ඉහල කොටසේ වම් කනට පහලින් ආරම්භ වී තිබුණි. එතැන් සිට එය ගැඹුරු වී දකුණු පසට යන්නට ක්‍රමයෙන් ගැඹුර අඩුවී යනු පෙනුණි. අනෙක් කෙළවර බෙල්ලේ දකුණු පැත්තේ, බෙල්ලේ මැද කොටසෙහි පිහිටි අතර එය කෙළවර වූයේ සිහින් දිගැති සීරීමකිනි.



*බෙල්ලේ කැපුම දකුණු පැත්තෙන් පෙනෙන අයුරු*

ආත්මාරක්ෂක තුවාල (defence injuries) කිසිවක් පිටත නොතිබුණි. එකිනෙකට සමාන්තර, සම පමණක් ගැඹුරැති තමා විසින් කරගත් කැපුම් තුවාල ශරීරයේ නොතිබුණි. බෙල්ලේ කැපුම හැර වෙනත් තුවාලයක් ශරීරයේ නොතිබුණි. පෙණහලු වල ලේ පිරී තිබුණි. රුධිරය පරීක්ෂණයෙන් මත්පැන් හෝ වස නොදකින ලදී. බිරිඳ කියා තිබුනේ ඔහු දකුණත් පුද්ගලයෙකු බවයි.

මරණයට හේතුව ලෙස තීරණය කලේ "බෙල්ලේ කැපුමයි". පරීක්ෂණය එතැනින් නැවතිය නොහැකිවිය. මිනිමැරුමක්ද,

සියදිවි නසා ගැනීමක්ද යන්න විසඳිය යුතුය. එය මිනිමැරුමක් නම් මිනිමරුවා කවුද යන්න සෙවිය යුතුය.

සාකච්ඡාව

බෙල්ලේ කැපුම් තුවාල වර්ග 2 ක් සාමාන්‍යයෙන් හඳුනාගත හැකිය. එනම්

01. අමෝරා ගසන කැපුම් - (slasted cuts)

02. සම දිගේ ඇදීමෙන් කරන කැපුම් - (drawn cuts) ලෙසය.

අමෝරා ගසන කැපුම් වල ගැඹුරුම ස්ථානය වන්නේ තුවාලයේ මධ්‍යයි. එමෙන්ම ඒවායේ සමහර විට දෙකෙලවරම රේඛිය සීරීම් දකිය හැකිය. නමුත් සම දිගේ අදින කැපුමක ගැඹුරුම වන්නේ එහි ආරම්භක කෙළවරයි. එය ක්‍රමානුකූලව නොගැඹුරු වී අවසන් වන්නේ සිහින් රේඛිය සීරීමකිනි. මෙම මරණකරුගේ තුවාලයේ ගැඹුරුම වුයේ වම් කෙලවරයි. ඊට අමතරව එය දකුණු කෙළවර තෙක් නොගැඹුරු වී රේඛිය සීරීමකින් අවසන් වෙයි. මේ නිසා මෙය සම හරහා ඇදීමෙන් ඇතිවූ කැපුමක් (drawn cuts) විය යුතු අතර එය වම් පසින් ආරම්භ වී දකුණු පසින් කෙළවර විය යුතුය.

"බෙල්ලේ කැපුම" තුන් ක්‍රමයකට ඇතිවිය හැකිය. මිනිමැරුමක්, සියදිවි නසා ගැනීමක් හෝ අහඹු සිද්ධියක් ලෙසයි.

අහඹු බෙල්ල කැපීම් ඇතිවන්නේ කලාතුරකිනි. එනම් පුද්ගලයකුගේ හිස වීදුරුවක් හරහා පසාරුවීමෙන් හෝ විසිව එන වීදුරු කැබැල්ලක් බෙල්ලේ වැදීමෙන් හෝ තියුණු මිසයිලයක් බෙල්ලේ වැදීමෙනි. මෙම සිද්ධියේදී වාහනයේ විදුරු කැඩී නොතිබුණ අතර අනතුරකින් සිදුවන බෙල්ලේ කැපීමක් නොවන බව ඉන් තහවුරු විය.

සියදිවි නසා ගැනීමකදී සාමාන්‍යයෙන් බෙල්ලේ කැපීම ආරම්භ වන්නේ බෙල්ලේ පැත්තක ඉහළ කොටස් වන අතර, එය අවසන් වන්නේ බෙල්ලේ අනෙක් පැත්තේ මධ්‍යම කොටසේය. මෙම මියගිය පුද්ගලයා දකුණත් පුද්ගලයකු වූ බැවින් කැපුම් ආරම්භ විය යුත්තේ බෙල්ලේ වම් පසින් වන අතර එය අවසන් විය යුත්තේ බෙල්ලේ දකුණු පසය. මරණ කරුගේ තුවාලය එයට සමාන විය. එසේනම් මෙය සියදිවි නසාගැනීමක් ද?

සියදිවි නසා ගැනීමකදී බොහෝවිට "හෙසිටන්ට්" (hesitant cuts) කැපුම් සාමාන්‍යයෙන් දකිය හැකියි. එනම් මරණීය කැපුම යෙදීමට ප්‍රථම සියදිවි නසාගන්නා පුද්ගලයා සම පමණක් ගැඹුරැති කෙටි කැපුම් කිහිපයක් යොදෙයි. එවැනි "හෙසිටන්ට්" කැපුම් මෙම මරණකරුගේ නොතිබුණි. සමහරවිට භාවිතා කරන ආයුධය අතේ තවමත් සිරවී තිබිය හැකිය. නැතිනම් සාමාන්‍යයෙන් ආයුධය සිද්ධිය වූ ස්ථානයේ පවතියි. නමුත් මෙම මරණකරුගේ අතෙහි හෝ ස්ථනයේ තිබී ආයුධයක් හමුවූයේ නැත. තවද සියදිවි නසාගන්නා පුද්ගලයින් ඊට ප්‍රථමවද එවැනි කැපුම් තුවාල කරගත් තුවාල කැලැල් තිබිය හැකිය. උදාහරණයක් ලෙස තමා විසින්ම කරගත් තුවාල කැලැල් (self inflicted scars) තිබිය හැකිය. ඒවා සම පමණක් ගැඹුරු එකිනෙකට සමාන්තර තුවාලයි. ඒවා ශරීරයේ තමා විසින් කර ගත හැකි ස්ථාන වල පමණක් දැකිය හැකිය. උදාහරණ ලෙස අතේ යටි භාහුව, පපුව ආදිය හැඳින්විය හැකිය. එ තමා විසින්ම කරගත් තුවාල කැලැල් මෙම පුද්ගලයා නොතිබුණි. මේ නිසා සිද්ධි ඉතිහාසය, ස්ථාන පරීක්ෂා සහ පශ්චාත් මරණ පරීක්ෂණ දත්ත මත "සියදිවි නසාගැනී ඉවත් කළ හැකිය.

මිනිමැරරමක් ලෙස සිදුවන බෙල්ල කැපුම් තුවා දෙයාකාරයකින් සිදුවිය හැකිය. එනම් ඉදිරියෙන් සිදුකරන හා පිටුපසින් සිදුකරන බෙල්ල කැපීම් ලෙසයි. ඉදිරිපසින් සිදුවන බෙල්ල කැපීම් තුවාල දිග නැත. ඒවා කොටය බොහෝවිට ආනතය. සමහර විට හරස් අතටම පිහිටයි ඉදිරියෙන් බෙල්ල කපන විට බොහෝවිට එකකට වඩා වැඩි ගනනක් කැපුම් කරන අතර, එවා අමෝරා හෝ සම දිගේ ඇදෙන කැපුම් විය හැකිය. එවැනි කොට තුවාල මියගිය පුද්ගලයාගේ බෙල්ලේ දකිය නොහැකි විය.

නමුත් සාමාන්‍යයෙන් බෙල්ල කපන්නේ පිටුපසින් පැමිණය. එවිට හිස පිටුපසට නවා, පිහිය බෙල්ල හරහා අදියි. එනම් දකුණත් පුද්ගලයෙකු නම් පිහිය බෙල්ලේ වම් පස සිට දකුණු පසට අදියි. පිටුපසින් කරනු ලබන බෙල්ලේ කැපුමකදී එහි ආරම්භය ගැඹුරුය. ක්‍රමයෙන් නොගැඹුරු වී සිහින් සීරීමකින් අවසන් වන්නේ බෙල්ලේ විරුද්ධ පැත්තෙනි. උදාහරණ වශයෙන් දකුණත් පුද්ගලයකු බෙල්ල කැපුවේ නම් එය ආරම්භ වන්නේ මිය ගිය අයගේ බෙල්ලේ වම් පැත්තේ ඉහළ කොටසින් වන අතර, ඉන්පසුව එය බෙල්ලේ ඉදිරි පස හරහා ඇලට ගමන් කර අවසන් වන්නේ බෙල්ලේ දකුණු පැත්තේ සිහින් සීරීමක් ලෙසයි. එම නිසා මෙම මරණකරුගේ බෙල්ලේ කැපුම දකුණත් පුද්ගලයකු විසින් පිටුපසින් කළ කැපුමකට සමානකම් දක්වයි.

සාමාන්‍යයෙන් පිටුපසින් කරන බෙල්ලේ කැපීමකදී තුවාල එකකට වඩා දකිය හැකිය. එයට හේතුව මරණකරුගේ දගලීමක් හෝ මරණකරුගේ හිස හොඳහැටි නොසෙල්වන ලෙස තදකර නොගැනීම හෝ හිංසා කිරීමේ අරමුණ (torture) විය හැකිය. මෙම මරණකරුගේ රුධිරයේ ඇල්කොහොල් නොතිබුණි. මේ නිසා තනි කැපුමක් බෙල්ලේ තිබීමෙන් තහවුරු වන්නේ මරණ කරුගේ හිස වාහනයේ සීට් එකට හොඳින් තදවන ලෙස පිටුපසින් අල්ලා ගෙන ඇති බවයි.

ලේ ලප ඩෑෂ්බෝඩ් එකේ හා වින්ඩ්ස්ක්‍රීන් එකේ තිබීමෙන් තහවුරු වන්නේ බෙල්ලේ ධමනි කැපෙන අයුරින් ගැඹුරු කැපුමක් කර ඇති බවයි. කමිසයේ තිරස් අතට වූ ලේ දහරා තිබීමෙන් නැවත තහවුරු වන්නේ මිය යන විට ඔහු මෙම වාහනයේ රියදුරු අසුනේ ඉඳගෙන ඉන්නට ඇතිය යන්නයි.

සමහර බෙල්ලේ කැපුම් සිදුකරන්නේ හදිසි කෝපයටය. සමහර ඒවා සිදුකරන්නේ ඉතා දරුණු සංවේදී ලිංගිකත්වයට අදාළ හේතු, පළිගැනීම් ආදි හේතු සඳහායි. තම භාර්යාව හෝ මිතුරිය වෙත පිරිමියෙකු සමග ප්‍රේමය වැනි ඉතා සංවේදී ලිංගික හේතුවකට, පළිගැනීමකට කරන මිනීමැරුම් වලදී "ඕවර් කිලිං" (over - killing) ලක්ෂණ දකිය හැකිය. ඒවා එක සමාන ප්‍රමාණයේ සමාන්තර හා එක ස්ථානයක පවතින (cluster) කැපුම් හෝ ඇනුම් විය හැකිය. එවැනි තුවාල මෙම මරණකරුගේ නොදකීමෙන් හැඟි යන්නේ මෙය හදිසි කෝපයට පත්වූ පුද්ගලයකුගේ මිනිමැරුමක් ලෙසය. අවසානයේ මරණයට හේතුව ලෙස ලබා දුන්නේ බෙල්ලේ

දරුණු කැපුමයි. ඉන් ඇති වූ අධික රුධිර වහනය නිසා පුද්ගලයාගේ මරණය සිදු වී ඇත.

බෙල්ලේ කැපුමකින් පසුව මරණය පත් වීමට ගතවන කාලය කරුණු කිහිපයක් මත තීරණය වෙයි. එනම් ශිරා කැපීම, ධමනි කැපීම, හෘදයට හුලං ඇතුළුවීම ආදියයි. ස්ථානයේ තිබූ අධික රුධිර ප්‍රමාණයත් වීදුරු වල තිබූ ලේ ලපත් මගින් පෙනෙන්නේ මෙය ඉතා දරුණු තුවාලයක් බවත්, ඔහු තත්පර හෝ විනාඩි කිහිපයකට වඩා ජීවත් විය නොහැකි බවත් ය.

## අවසන් නිගමනය

පශ්චාත් මරණ පරීක්ෂණ කරුණු අනුව මෙය මිනී මැරුමක් වන අතර එය සිදුකර ඇත්තේ දකුණත් පුද්ගලයකු විසින් පිටුපසින් බවත්, එම අවස්ථාවේ මරණකරුගේ හිස හොඳින් තදවන ලෙස රියදුරු අසුනට තදකර බෙල්ලේ කැපීම සිදුකර ඇති බවත් නිගමනය කෙරිණි.

දින කිහිපයකට පසුව සැකකරුවෙකු ඉදිරිපත් කළ අතර ඔහ කියා සිටියේ මෙම මරණකරු තම තරුණ පුතා සමඟ වසර කිහිපයක් පුරා සමලිංගික සම්බන්ධතාවයක් පවත්වා ඇති බවයි. තම පුතාට කසාද කිහිපයක් සූදානම් කළද ඔහු ඒවාට එකඟ නොවුනේ මෙම මරණකරුගේ බලපෑම් මත බව ඔහු කීය. මරණය වූ දිනයේ සැකකරු හා ඔහුගේ පුතා මරණකරුගේ වාහනයට ගොඩවූයේ ඒ පිළබඳ කතා බහ කිරීමටය. පියා රියදුරු අසුනට පිටුපස අසුනේ ඉඳගත් අතර පුතා ඉදිරිපස අසුනේ ඉඳගත්තේය. මෙම සමලිංගික සම්බන්ධතාවය නැවැත්වීමට පියාගේ දැඩි ඉල්ලීම මරණකරු ප්‍රතික්ෂේප කළ අතර එවිට කෝපයට පත් පියා, තමා රැ ගෙන ආ පිහියෙන් මරණකරුගේ ගෙල කපා පුතා සමඟ පැන ගියේය. සැකකරු දකුණත් කාරයෙකි. තවද පශ්චාත් මරණ පරීක්ෂණ දත්ත සැකකරුගේ ඉතිහාසය සමඟ ගැළපුනි. "බෙල්ල කැපීම" අධිකරණ වෛද්‍ය අභියෝගය බව මින් මනාව වැටහේ.

— — — — —